එම විළුඹු හිමියන්ට අපා ගින්නේ විනාශය අත්වේවා! ඔබ වුළූ දෝවනය පූර්ණවත් කරනු මැනව" යැයි පැවසූහ

අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: අපි අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) සමග මක්කාවේ සිට මදීනාව බලා නැවත පැමිණෙමින් සිටියෙමු. මාර්ගයේ ජලය ඇති ස්ථානයක් අසළට පැමිණි විට අසර් සලාතය
සඳහා පිරිස ඉක්මන් වූහ. කඩිමිඩියේම ඔවුන් වුළූ දෝවනය කළහ. අපි ද අවසන් කොට ඔවුන් වෙත සේන්දු වූයෙමු. ජලය නොතැවරුනු ඔවුන්ගේ විළුඹු දිස් වන්නට විය. එවිට අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ "එම විළුඹු හිමියන්ට
අපා ගින්නේ විනාශය අත්වේවා! ඔබ වුළූ දෝවනය පූර්ණවත් කරනු මැනව" යැයි පැවසූහ.
[صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මක්කාවේ සිට මදීනාව දක්වා තම සහාබාවරුන් සමග ගමන් ගත්හ. ඔවුන් එන මාර්ගයේ ජලය හමු වූහ. ඇතැම් සහාබාවරු අසර් සලාතය සඳහා කඩිමඩියේ වුළු ගන්නට ආරම්භ කළහ. ඔවුන්ගේ පාදවල ජලය නොතැවරුණු වියළී ගිය තැන් ද දකින්නට විය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ වුළූ ගන්නා අවස්ථාවේ පසුපස පාද සේදීමේදී අඩුපාඩු ඇති කළවුනට අපා ගින්නේ විනාශය හා දඬුවම අත්වේවා යැයි පවසා වුළූ දෝවනය සම්පූර්ණ කිරීමේදී පූර්ණවත්ව ඉටු කරන මෙන් ඔවුනට නියෝග කළහ.

http://www.sunnah.global/hadeeth/si/show/66392